மாகாணக் கல்வித் திணைக்களம்
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education**

கிழக்கு மாகாணம், திருகோணமலை
නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය
Eastern Province, Trincomalee
026-2222556, Fax: 026-2222871
www.eastpde.edu.lk

எனது இல / මගේ අංකය / My No: EP/20/02/08/Ann.Tra/2025

திகதி / දිනය / Date: 2026.10.26

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන් වෙත
නැගෙනහිර පළාත,

**අන්තර් කලාප වාර්ෂික ගුරු ස්ථාන මාරු යෝජනා 2027(2026)**
**නැගෙනහිර පළාත (සිංහල සහ දෙමළ මාධ්‍යන්)**

නැගෙනහිර පළාතේ පාසල්වල සේවය කරන ගුරුවරුන් සඳහා වන අන්තර් කලාප වාර්ෂික ගුරු ස්ථාන මාරු වීම් - 2027(2026) සඳහා අයදුම් කල ගුරුවරුන්ගේ අයදුම්පත් ,ජාතික ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තියටද අනුකූලවද, නැගෙනහිර පළාත් ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තියටද අනුකූලවද, සහ ස්ථාන මාරු මණ්ඩලයේ තීරණවලටද අනුකූලව ද 2027(2026) වර්ෂයට අදාල අන්තර් කලාප ගුරු ස්ථාන මාරු වීම් යෝජනා ඉදිරිපත් කරනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

ඒ අනුව ස්ථාන මාරුවීම් සඳහා යෝජිත ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ස්ථාන මාරු ලේඛණය මේ සමඟ අමුණා ඇති අතර, අන්තර් කලාප වාර්ෂික ගුරු ස්ථාන මාරු වීම් 2027(2026) සඳහා වන ස්ථාන මාරු යෝජනා පිළිබඳව සෑහීමකට පත් නොවන ගුරුවරුන් තම අභියාචනා අයදුම්පත් මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලව A4 ප්‍රමානයේ කඩදාසියක දෙපැත්තෙම සකස් කර , සම්පූර්ණ කරන ලද අයදුම්පත් තම පාසලේ විදුහල්පති සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය සහිතව "පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්ත මේන්තුව,නැගෙනහිර පළාත,ඇතුළු වරාය පාර,ත්‍රිකුණාමලය," යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එළඹෙන 2026.11.10 වන දිනට පෙර අප වෙත ලැබෙන සේ එවිය යුතුය. එසේ නොමැතිව අප වෙත සෘජුවම ලැබෙන සහ 2026.11.10 වන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන බව ද දන්වා සිටිමි.

එස්.ආර්.හසන්ති මිය,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

S.R. Hasanthi
Provincial Director of Education
Eastern Province